# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1944/2 - 2015 දෙසැම්බර් මස 07 වැනි සඳුදා - 2015.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 ''අ'' වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ලියාපදිංචි අංක PV 94125 දරන සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මෙහි උපලේඛනයේ II වන තීරයේ වූ අනුරූප සටහන්වල කෙටි යෙදුම්වල නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වෙන උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් එහි උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස එම නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය පිළිගෙන සිටිමි.

**උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධි* | *II වන තීරය*<br>*සුදුසුකම් පිළිබඳ කෙටි යෙදුම්* |
|---|---|
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | බී ඒ (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | බී ඒ (විශේෂ) (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | එම් ඒ (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය | එම් ෆිල් (බෞද්ධ අධ්‍යයනය) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 04 වැනි දින.
කොළඹ දී ය.

12 - 688


1A - PG 2712 — 506 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*